# 40-60 දශකයන්හි ශ්‍රී ලාංකීය වාර්තා සිනමාව හා එහි භාවිතාව පිළබඳ අධ්‍යනයක්

**එස්. ආර්. පී. චතුමි විදුෂිකා & එස්. තීක්ෂණ ප්‍රීතිරත්න**


## Abstract

ජගත් සිනමාවේ ආරම්භය සිදුවන්නේම වෘත්තාන්තමය ලක්ෂණයන්ට වඩා වාර්තාමය සිනමා ලක්ෂණ වැඩි වශයෙන් ආරෝපණය කරගනිමින් නිර්මාණය වූ චලන චිත්‍රයන්ගෙන් බව පෙනී යන කරුණකි. යටත් විජිතකරණයේ ප්‍රතිඵලයක් ලෙස, ලෝක සිනමාව ආරම්භ වී වසර පහක් ගතවීමටත් පෙර එකී සිනමාත්මක අත්දැකීම් ලබන්නට ලංකාවට හැකි විය. ශ්‍රී ලාංකීය චිත්‍රපට නිෂ්පාදනය සිදුවීමට පෙර සිටම බ්‍රිතාන්‍ය ජාතිකයින් තම චිත්‍රපට නිෂ්පාදන කටයුතු සඳහා ලංකාව යොදාගෙන ඇති බවට ප්‍රධානතම නිදර්ශනයක් ලෙස බැසිල් රයිට් ගෙ A Song of the Ceylon (ලංකාවේ ගීතය) චිත්‍රපටය දැක්විය හැකිය. එය නිර්මාණය වන්නේ 1934 දී වන අතර ඉන් වසර දාහතරකට පසු එනම් 1948 දී නිදහස් ලංකාව තුළ රජයේ චිත්‍රපට අංශය පිහිටුවා චිත්‍රපට නිෂ්පාදන කටයුතු අරඹන ලදී. වාර්තා චිත්‍රපටය යනු එය නිර්මාණය වන්නා වූ යුගයේ පිළිබිඹුවකි. වෘත්තාන්තමය ස්වභාවයෙන් වාර්තා චිත්‍රපටය වෙන් වන ප්‍රධානම ආකාරය නම්, එය සත්‍ය ඒ අයුරෙන්ම ගෙනහැර දක්වන ස්වභාවයයි. 40-60 යනු ශ්‍රී ලාංකීය සිනමාවේ ආරම්භක යුගය වන අතරම එය නිදහස් ලංකාවේද මුල් යුගයයි. මෙම අධ්‍යයනයේදී නිරීක්ෂණය වූ කරුණු අනුව මෙම යුගයට අදාලව, අද වන විට නැරඹීමට හෝ තොරතුරු සොයාගත හැකි චිත්‍රපට සංඛ්‍යාත්මකව දැක්වුවහොත් 145ක් වන අතර ඉන් බහුතරයක් ශ්‍රී ලංකා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු සංරක්ෂණාගාරය සතුව පවතී. ශ්‍රී ලාංකීය වෘත්තාන්තමය සිනමා ඉතිහාසය පිළිබඳව බොහෝ අධ්‍යනයන් සිදුවී තිබුනද වාර්තා සිනමාව තේමා වූ එබඳු විධිමත් අධ්‍යයනයන් ඉතා අල්පය. ජාත්‍යන්තර සම්මානයන්ට පවා පාත්‍ර වූ මෙම යුගයේ වාර්තා සිනමා නිර්මාණයන්හි ස්වාභාවය පිළිබඳවත් කලාත්මක ලක්ෂණයන්ට අමතරව එය සමාජීය ප්‍රගමනය උදෙසා කෙබඳු උපයෝගීතාවයක් දැක්වූවේද යන්න පිළිබඳවත් නිරීක්ෂණය, ඒ අනුව වැදගත් වේ. එම නිරීක්ෂණයන්ට අනුව දැකිය හැකි වන්නේ මෙකී යුගයේදී සිදු වූ සමාජ දේශපාලනමය හා සංස්කෘතිකමය විපර්යාස එම යුගයේ වාර්තා චිත්‍රපට තුළ මනාව ගැබ්වී ඇති බවයි. නිදහස් ලංකාව තුළ නව දේශපාලනමය, සංවර්ධනමය ක්‍රියාදාමයන් හා සෞඛ්‍යමය දැනුවත් කිරීම් උදෙසාත් ප්‍රතිශතයක් ලෙස ගත් කළ 60% කට වැඩි වශයෙන් මෙය ජනමාධ්‍යයක් ලෙස භාවිතා වී ඇත. මීට අමතරව සංචාරක, ආගමික, කෘෂිකාර්මික හා සමාජ විද්‍යාත්මක ආදී භාවිතාවන්ගෙන් යුක්ත සිනමා නිර්මාණ ද දැකිය හැක. වාර්තා චිත්‍රපටය හුදු සිනමාත්මක ලක්ෂණ පමණක් නොව බහුවිධ භාවිතාවන්ගෙන් යුක්ත වූ බවද මේ අනුව පෙනී යයි.



**ප්‍රමුඛ පද**

වාර්තා සිනමාව, ලාංකීය වාර්තා සිනමා ඉතිහාසය, වාර්තා සිනමා භාවිතාව, ශ්‍රී ලාංකීය සිනමාවේ ආරම්භක යුගය, රජයේ චිත්‍රපට අංශය


සිනමාවේ ආරම්භය කලාත්මක හෝ නිර්මාණාත්මක වෑයමක් නොවූ අතර එය විද්‍යාත්මක පර්යේෂණයක ප්‍රතිඵලයකි. මුල්ම චලන රූප නිර්මාණ ශිල්පීන්, එනම් චිත්‍ර පටයේ ආරම්භක පුරෝගාමීන් චිත්‍රපට අධ්‍යක්ෂවරුන් නොව, විද්‍යාඥයන් වන්නේ එබැවිනි. අමෙරිකාවේ විසූ තෝමස් අල්වා එඩිසන් (Thomas Alva Edison) ද, ප්‍රංශයේ ලුමියර් සහෝදරයන්ද (Lumiere) ද සිනමාකරණයේ පුරෝගාමීන් ලෙස හැඳින්වේ.

වාර්තා සිනමාවේ ආරම්භක පුරෝගාමියා ලෙස හඳුන්වනු ලබන්නේ ජෝන් ග්‍රියර්සන් (John Grierson 1898-1972) නම් අද්විතීය ශිල්පියාය. ජෝන් ග්‍රියර්සන් උපතින් ස්කොට් ජාතිකයෙකි. වාර්තා චිත්‍රපට සඳහා ඉංග්‍රීසියෙහි Documentary යන පදය පළමුවෙන්ම භාවිතා කරන ලද්දේ ඔහු විසිනි. ඔහු එය ගෙනහැර පෑවේ, 1925 දී Robert Flaherty විසින් නිර්මාණය කරන ලද "Moana" නම් චිත්‍රපටය උදෙසාය. (ආරියදාසඃ2000)

ශ්‍රී ලංකාව දීර්ඝ කාලීන ශක්තිමත් සංස්කෘතියකට හා සභ්‍යත්වයකට උරුමකම් කියන රටක් බව ලෝකයට කියාපෑමේ පුරෝගාමී මාධ්‍ය වූයේ වාර්තා චිත්‍රපටයයි. ලෝකයේ සිනමාව ආරම්භ වී වසර

5 ක් ගතවීමටත් පෙර එහි අත්දැකීම් ලබාගැනීමට ලාංකිකයන්ට හැකිවීමට ඒ වනවිට පැවති යටත් විජිත පාලනය හේතුවිය.

ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට චිත්‍රපටයක් ප්‍රදර්ශනය කර ඇත්තේ 1901 බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති අවධියේය. එකල ලංකා ආණ්ඩුකාරධූරය දරූ වෙස්ට් රිජ්වේ උතුමාණන්ගේ ප්‍රධානත්වයෙන් මෙම වාර්තා චිත්‍රපට ප්‍රදර්ශනය පවත්වා ඇත. මෙහිදී ශ්‍රී ලාංකික ප්‍රදර්ශනයට පත් ප්‍රථම චිත්‍රපටය වාර්තා චිත්‍රපටයක් වීම විශේෂත්වයක් ලෙස සැලකිය හැක. ආරාධිත බ්‍රිතාන්‍ය ජාතියන්ටත් ඉංග්‍රිසි උගත් ලාංකික පිරිසකටත් මෙම සිනමා දර්ශනය සීමා වූ බව සරසවි පුවත් පතට ග්‍රැන්විල් සිල්වා මහතා ලියන ලද සිංහල සිනමා ඉතිහාසයක පසුබිම නම් වූ ලිපියක සඳහන් වී ඇත. අප්‍රිකාවේ බෝයර් යුද්ධයේ ජයග්‍රහණයත් , වික්ටෝරියා රැජිනගේ අවමගුල් උත්සවයත්, එංගලන්තයේ VII වන ජෝර්ජ් රජතුමාගේ මෞලි මංගල්‍යයත් මෙම චිත්‍රපට ප්‍රදර්ශනයට ඇතුළත් වූ බව සඳහන්ය.

වර්ෂ 1901 මෙරට පළමු වරට චිත්‍රපට ප්‍රදර්ශනයක් පැවැත්වූ බව පිළිගත් මතය වුවද ඊට පෙරද චිත්‍රපට දර්ශන පැවැත්වූ බැව් 1898-01-08 වන දින "දිනපතා ප්‍රවෘත්ති" නම් පුවත්පතේ සඳහන් වේ. 1898 වර්ෂයේ පබ්ලික් හෝල් නම් ශාලාවේ සිනොමැටික් ග්‍රාෆ් නම් යන්ත්‍රයකින් "ඉංග්‍රිසි ක්‍රිකට් ගසන්නෝ" , "ග්‍රීක් තුර්කි යුද්ධය" යන වාර්තා චිත්‍රපට දෙක ප්‍රදර්ශනය කළ බවද සඳහන් වේ. මෙම චිත්‍රපට දර්ශන පවත්වා ඇත්තේ ලුමියර් සහෝදරයින්ගේ නියෝජිතයන් විසිනි (මෙන්ඩිස්:2003:21).

රජයේ චිත්‍රපට අංශය (Government Film Unit- GFU) නිල වශයෙන් සිය කටයුතු ආරම්භ කරන ලද්දේ 1948 සැප්තැම්බර් මාසයේදීය. එවකට පැවති රජයේ අග්‍රාමාත්‍යවරයා වූයේ ඩී. එස්. සේනානායකය. මුදල් අමාත්‍යවරයා වූයේ ජේ. ආර්. ජයවර්ධනයි. රජයේ චිත්‍රපට අංශය පිහිටුවනු ලැබුවේ විදේශිකයන් දෙදෙනෙකුගේ භාරකාරත්වය යටතේය. ඔවුහු ඉතාලි ජාතිකයෝ වූහ. එක් අයෙකු වූ ජූලියෝ පෙට්‍රෝනි චිත්‍රපට අධ්‍යක්ෂකයෙකු වූ අතර අනෙක් පුද්ගලයා වූ ෆෙඩ්රිකෝ සේරා සිනමා කාර්මික ශිල්පියෙකු විය. ඔවුන් දෙදෙනා මෙම කටයුත්තට සම්බන්ධ වීම අහඹු සිදුවීමක් විය. 1947 වර්ෂයේ ලාංකේය ව්‍යාපාරිකයන් කීපදෙනෙකු එකතුව පිහිටුවාගනු ලැබූ "විශ්වරංග මූවිටෝන් "නැමැති චිත්‍රපට සමාගමේ අවශ්‍යතාව වූයේ එවකට ජනප්‍රිය නවකතා කරුවෙකුව සිටි ඩබ්ලිව්. ඒ. සිල්වාගේ නවකතාවක් චිත්‍රපටයට නැංවීමයි. පෙට්‍රෝනි හා සේරාට ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස ආරාධනා කරනු ලැබ ඇත්තේ එම සමාගම විසිනි. නමුත් මේ වනවිට එම චිත්‍රපට සමාගම අකර්මන්‍ය වූයෙන් එම ශිල්පීන් දෙදෙනාට ආගිය අතක් නොමැති විය. අගමැතිවරයා හා මුදල් ඇමතිවරයා හමුවූ ඔවුහු රජයේ චිත්‍රපට අංශයක් ආරම්භ කිරීමට යෝජනා කළහ. මේ වනවිට 1948 අප්‍රේල් මාසයේදී ඉන්දියානු රජය විසින් ඉන්දියානු රජයේ චිත්‍රපට අංශය (The Government Films Division of India) පිහිටුවා තිබුණි. පෙට්‍රෝනි හා සේරාගේ භාරකත්වය යටතේ රජයේ චිත්‍රපට අංශය පියිටුවන ලද්දේ 1948 සැප්තැම්බර් මස 17 වැනිදා කොළඹ ජාවත්ත පාරේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ලබාගත් කුඩා කාමරයකය. අවශ්‍ය කැමරා උපකරණ ඉතාලි ජාතිකයන් දෙදෙනා සතුව තිබුණි (රත්නවිභූෂණ 2012:13).

එවකට ප්‍රවෘත්ති නිලධාරියාවූ එච්. ඒ. ජේ. හුලුගල්ලගේ 1950-02-15 සටහනකට අනුව රජයේ චිත්‍රපට අංශය බිහිකළ චිත්‍රපට අතරින් පළමු කාණ්ඩයට අයත්වූ චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා මුදාහැර ඇත්තේ 1949 ජූනි මාසයේදීය.

- ලංකාව නිදහස ලබාගැනීමේ පළමු සංවත්සරය (මිනිත්තු 20)
- ලංකා පාර්ලිමේන්තුවට බ්‍රිතාන්‍යයේ තිලිණය (මිනිත්තු 10) (මෙම චිත්‍රපටයෙන් දැක්වූයේ කථානායක අසුන හා වේත්‍රය බ්‍රිතාන්‍ය රජයේ තිලිණයන් ලෙස ලංකාවට ප්‍රධානය කිරීමයි)
- Air Ceylon New Wings (මිනිත්තු 10) (මෙරට ගුවන් ගමන් ඉතිහාසයේ නව සංධිස්ථානයකට මුලපුරමින් 'ලක්ෂපාන' හා 'රත්මලාන' නැමැති යානා දෙක එංගලන්තයේ සිට ලංකාවට ගෙන ඒම )
- Inauguration of the town of Anuradhapura අනුරාධපුර නව නගරය විවෘත කිරීම.
- Ceylon's farewell to Sanchi relics (මිනිත්තු 10) (ඉන්දියාවෙන් මෙරටට වැඩමකරවූ සාංචි ධාතු ආපසු ඉන්දියාවට වැඩමකරවීම පිළිබඳවය)

හුලුගල්ලයන්ගේ සටහනට අනුව දෙවන කණ්ඩායමට අයත්වූ චිත්‍රපට මේවා විය.

- Hill Capital (කඳුරට අගනුවර) මිනිත්තු 30 පෙට්‍රෝනි ගේ අධ්‍යක්ෂණයකි.
- Commonwealth Conference (පොදුරාජ්‍ය මණ්ඩලීය සමුළුව)

- I.L.O. Conference (ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සමුළුව) මිනිත්තු 06
- A Ceylon Diary-1949 (මිනිත්තු 10)

මේ අතර ඉතාලියෙන් පැමිණි ජෝර්පියෝ කලබ්‍රියා (Georgio Calabria) රසායනාගාර කටයුතු සඳහාද, ජෝර්ජ් වික්‍රමසිංහ ඔහුගේ සහයකයා ලෙසද රජයේ චිත්‍රපට අංශයට එක්විය.

1950 වර්ෂයේදී රජයේ චිත්‍රපට අංශය ජාවත්ත පාරේ සිට කලින් බ්‍රිතාන්‍ය හමුදා කඳවුරක්ව පැවති මොරටුවේ පොල් වත්තකට (වෙලෝනා) ගෙන එන ලද අතර 1954 දී එහි කොටසක් (රසායනාගාරය ඇතුළුව) කිරුළපන පොල්හේන්ගොඩ වර්ථමාන පරිශ්‍රයට ගෙන එය ලදී. ශබ්ද අංශය මොරටුවේ පැවති අතර එයද 1971 දී පොල්හේන්ගොඩ පරිශ්‍රයට අනුයුක්ත කරන ලදී (රත්නවිභූෂණ 2012:16).

ජුලියෝ පෙට්‍රෝනි විසින් අධ්‍යක්ෂණය කරන ලද චිත්‍රපට ලෙස, නව දිවිය (New Horizons) ද කඳුරට අගනුවර (Hill Capital) ද Air Ceylon new wings ද දැක්විය හැක. ඔහුට සමකාලීන අධ්‍යක්ෂකවරායකු වූ ෆෙඩ්රිකෝ සේරා විසින් අධ්‍යක්ෂණය කළ අගනා වාර්තා චිත්‍රපටයක් ලෙස "රාජකීය තැපැල් සේවය" (Royal Mail) දැක්විය හැක. මීට අමතරව ඔහු තැනූ Census හා සාත්තුසේවය වෘත්තීයක් වශයෙන් නගාසිටුවීම සඳහා නිර්මාණය කළ Nursing Today යන කෘතීන්ද වැදගත් කෘතීන් ලෙස දැක්විය හැක.

පෙට්‍රෝනිගෙන් පසු රජයේ චිත්‍රපට අංශයට පත්වූ නව නිලධාරියා වූයේ රැල්ෆ් කීන් ය. ඔහු බ්‍රිතාන්‍යයේ ස්වභාව සෞන්දර්ය හා ගැමි ජීවිතය පිළිබඳ පසුබිම් වූ චිත්‍රපට තැනීමෙහි ප්‍රසිද්ධ ශිල්පියෙකු විය. ඔහු ශ්‍රී ලංකාවේදී කළ වාර්තා සිනමා කෘති අතරින් වටිනාම කෘතිය ලෙස හඳුන්වනු ලබන්නේ "ලංකා උරුමය" (Heritage of Lanka) නම් චිත්‍රපටයයි. අනෙක් කෘතීන් අතර "නෙළුම්ගම" (Nelumgama), " මිගමුවේ මස් මරන්නෝ" (Fishermen of Negombo) යන වාර්තා චිත්‍රපට වැදගත් ස්ථානයක් ගනී.

රැල්ෆ් කීන් ගෙන් පසු අවධියේ රජයේ චිත්‍රපට අංශය තුළ වූ ප්‍රතිභාසම්පන්න සිනමාකරුවන් අතරින් ජෝර්ජ් වික්‍රමසිංහ, ප්‍රඥාසෝම හෙට්ටිආරච්චි, ලෙස්ටර් ජේම්ස් පීරිස්, අර්වින් දසනායක, අබේකෝන් සෙනෙවිරත්න හා විල්ෆඩ් පෙරේරා වැදගත් තැනක් ගනිති. මොවුන් රජයේ චිත්‍රපට අංශය තුළ තහවුරුව පිහිටි සිනමාකරුවෝ වූහ. මොවුන් ජාත්‍යයන්තර වශයෙන් පවා සම්මානයට පාත්‍රවීමට තරම් සමත්වූහ.

රජයේ චිත්‍රපට අංශයේ ආරම්භයේ පටන්ම නොයෙකුත් තේමාවන්ට අනුව වාර්තා චිත්‍රපට නිර්මාණය වූ අතර එහි නොයෙක් භාවිතාවන්ගෙන් යුක්ත විය. ප්‍රධාන වශයෙන්ම, රජයේ ආයතනයක් ලෙස එම යුගයේ දේශපාලන හා සංවර්ධන ක්‍රියාදාමයන්හිදී විශාල දායකත්වයක් චිත්‍රපට අංශය මගින් සැලසිණි. එලෙස සිදුවූ භාවිතයන්ට අනුව වාර්තා චිත්‍රපට කොටස් කීපයකට බෙදා වෙන්කරගත හැක. 40- 60 දශකය ඇසුරෙන් ප්‍රතිශතාත්මක වශයෙන් එය මෙසේ දැක්විය හැක.

| | | |
|---|---|---|
| 1* | සංවර්ධන ක්‍රියාදාමය උදෙසා භාවිතය | - 22.5 % |
| 2* | සංචාරක ව්‍යාපාරය සඳහා භාවිත චිත්‍රපට | - 4 % |
| 3* | සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීම සඳහා භාවිතය | - 3.5 % |
| 4* | ආගමික භාවිතාවක් සහිත චිත්‍රපට | - 8.5 % |
| 5* | කෘෂිකාර්මික භාවිතාවක් සහිත චිත්‍රපට | - 5.5 % |
| 6* | සමාජ විද්‍යාත්මක භාවිතාවක් සහිත චිත්‍රපට | - 8.5 % |
| 7* | දේශපාලනික පුද්ගල හා උත්සව අවස්තා ප්‍රචාරණ භාවිතය | - 27.5 % |
| 8* | අධ්‍යාපනික භාවිතාවක් සහිත චිත්‍රපට | - 10.5 % |
| 9* | ක්‍රීඩා හා ප්‍රාසාංගික භාවිතාවක් සහිත චිත්‍රපට | - 9.5 % |





**Chart 1: Chart by the author.**

සංවර්ධන ක්‍රියාදාමය සඳහා භාවිතා වූ චිත්‍රපට පිළිබඳ විමසීමේදී ජුලියෝ පෙට්‍රෝනි විසින් අධ්‍යක්ෂනය කළ "නව දිවිය" වාර්තා චිත්‍රපටය වැදගත් තැනක් ගනී. මෙහිදී තේමාව වන්නේ පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය, හුරුළුවැව, දේවහූව, ඇලහැර ආදී යෝජනා ක්‍රම මගින් නව ගොවි ජනපද ඇති කිරීමයි.

මෙවැනිම අයුරින් යෝජනා ක්‍රමයක් මූලික වූ තවත් සිනමා පටයක් ලෙස "නිම්නයක හදවත්" (Song of the Valley) චිත්‍රපටය හැඳින්වීමට හැක. මෙය ගල්ඔය යෝජනා ක්‍රමය මුල් කර ගනිමින් ඩී. බී. නිහාල්සිංහ විසින් 1968 දී නිර්මාණය කරනු ලැබූවකි. ගල්ඔය ආශ්‍රිතව ගොවි ජනපද ව්‍යාපාරය ඇතිවීම 50 දශකය මුල් භාගයේදී එවකට අග්‍රාමාත්‍ය වූ ඩී. එස්. සේනානායක මහතාගේ මූලිකත්වයෙන් සිදු වූවකි. 60 දශකයේ අවසාන භාගයේ මෙම චිත්‍රපටය නිර්මාණය කරන විට එතුමා මියගොස් සිටියද එතුමාගේ සංකල්පය වූ මෙම ගොවි ජනපද ඇතිකිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඒ වන විට ස්ථාවර තත්වයකට වර්ධනය වී තිබූ ජනපදයන්හි ස්වරූපය නිරූපණය කිරීම චිත්‍රපටය හරහා සිදුකෙරිණි. මෙහිදී ඩී. එස්. සේනානායක මහතා පිළිබඳව ද යම් විස්තරයක් හා ඔහුගේ කතාවක්ද මෙයට ඇතුළත් කර තිබීම නිසා දේශපාලන භාවිතාව අතින්ද මෙය යම් වැදගත් කමක් ගනී. මුල් යුගයේ පදින්චි කෙරුණු පිරිසත් මේ වන විට ජනපදයන්හි වර්ධනය වී සිටින ද්විතීක පරම්පරාවේ අත්දැකීමුත් නිම්නයක හදවත චිත්‍රපටය ඔස්සේ නිරූපණය කරනු ලබයි.

මෙවැනි සංවර්ධන යෝජනා ක්‍රම පිළිබඳව නිර්මාණය වූ අනෙකුත් චිත්‍රපට ලෙස "Rebirth of a River Valley" , "Homes for the People" වැනි චිත්‍රපට හැඳින්විය හැක.

සංවර්ධනය සම්බන්ධයෙන් භාවිතාවට ලක්වන ලද චිත්‍රපට පිළිබඳව සලකා බැලීමේදී "නෙලුන්ගම" යනු අමතක කළ නොහැකි තවත් එක් නිර්මාණයකි. මෙහිදී තේමාව වී ඇත්තේ "ප්‍රජාතන්ත්‍රවාදය" යන සංකල්පයයි. ප්‍රජාතන්ත්‍රවාදී යහපත් සමාජයක් ගොඩනැගීම සඳහා මෙම සංකල්පය පිළිබඳව සමාජ දැනුවත් වීමක් තිබිය යුතු අතර එම කාර්යය සිදුකිරීමේ පරමාර්ථයෙන් "නෙලුන්ගම" චිත්‍රපටයේ භාවිතය සිදුවී ඇතිබව පෙනී යයි. එමෙන්ම ගම තුළ සංවර්ධන කාර්යය සිදුවන්නේ කෙලෙසකද යන්න පිළිබඳවද යම් සාකච්ඡාවක් සිදු කිරීමට මෙය භාවිත වේ.




**රූපය 2: නෙලුන්ගම චිත්‍රපටයේ ඡන්ද ප්‍රචාරණය දර්ශනයක්**

සංවර්ධන කාර්යයේදී අධ්‍යාපනයට ලැබෙන්නේද සුවිශේෂී ස්ථානයකි. මෙලෙස අධ්‍යාපන වැදගත්කම පිළිබඳ සමාජය දැනුවත් කිරීමේ භාවිතයක් සහිතව නිර්මාණය වූ චිත්‍රපට ලෙස

"Separative Processes", "විදෙ‍්‍යාදය හා විද්‍යාලංකාර", "හිරු උදාව" (කනතොළුව), "Pursuit of Learning" යන සිනමාපට හැඳිනවිය හැකිය.

මෙහි "Separative Processes" චිත්‍රපටය මගින් විද්‍යාත්මක අධ්‍යාපනය පිළිබඳ විවරණයක යෙදෙන අතර "විදෙ‍්‍යාදය හා විද්‍යාලංකාර" චිත්‍රපට මගින් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ද්විත්වයක් පිළිබඳ විස්තරාත්මක නිරූපණයක් සිදු කරයි. "Pursuit of Learning" චිත්‍රපටය ඔස්සේ දැක්වෙන්නේ නිදහස් අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබඳවයි.

මෙලෙස නිදහස් ලංකාවේ නව සංවර්ධනමය ක්‍රියාදාමයන් නිරූපනය කිරීම සඳහා භාවිත වූ චිත්‍රපට බොහෝ ප්‍රමාණයක් දැක ගත හැක. මේ අතර තවත් නිර්මාණයක් ලෙස Fredrico Serra විසින් නිර්මාණය කරන ලද "Royal Mail" නම් වාර්තා චිත්‍රපටය දැක්විය හැකිය . මේ මගින් ශ්‍රී ලංකාව තුළ තැපැල් සේවයේ ක්‍රියාකාරිත්වය නිරූපණය වේ. ලිපියක් යවන්නා විසින් තැපැල් පෙට්ටියට දැමූ පසු එය ලිපිය ලබන්නා වෙත ලැබීම දක්වා වූ ක්‍රියාවලිය මෙහිදී සිනමාපටයට නගා ඇත .

"Battle Aginst Crime" සිනමා කෘතිය විසින් නිරූපණය කර ඇත්තේ, අපරාධ වලින් තොර සාමකාමී රටක ජීවත්වන ආකාරය පිළිබඳවයි. මෙමගින් ගෙනහැර පාන්නා වූ අදහස වන "සාමකාමී රටක්" යනු සංවර්ධිත රාජ්‍යයකි. රටක සංවර්ධන ක්‍රියාවලිය සඳහා යුද්ධයෙන් හා අපරාධයන්ගෙන් තොර සාමකාමී රටක් පැවතීම කෙතරම් යෝග්‍ය වන්නේ දැයි සිනමා කෘතිය නැරඹීමෙන් අවබෝධ වේ.

මේවාට අමතරව, "ගමනාගමනය" යනුවෙන් ශ්‍රී ලාංකීය ගමනාගමන සේවය පිළිබඳවත්, "Technical training" හා "Teachers tomorrow" යන වාර්තා චිත්‍රපට මගින් ලලිත කලාව පිළිබඳව හා ගුරු පුහුණුව පිළිබඳවත් සාකච්ඡාවට බඳුන්කර ඇත. "Nursing today" වාර්තා චිත්‍රපටය නිර්මාණය කර ඇත්තේ හෙද සේවය සඳහා මහජනයා යොමුකර ගැනීමේ අභිප්‍රායෙන් බව පෙනී යයි. "Homes for the People" වාර්තා සිනමා කෘතියද ශ්‍රී ලංකාව තුළ පැවති නිවාස ගැටලුව පිළිබඳව හා ඒවාට විසඳුම් සෙවීමට ගත් රජයේ ක්‍රියාමාර්ගයන් පිළිබඳ වාර්තා ගතකර ඇත. "මහිලා ප්‍රබෝධය" වාර්තා චිත්‍රපටය මගින් කතා කරනු ලබන්නේ ශ්‍රී ලාංකීය මහිලා සමිතිය පිළිබඳවයි. කාන්තාවන් විසින් රටේ සංවර්ධනය උදෙසා සිදුවන දායකත්වයද මේ ඔස්සේ නිරූපණය කර ඇත. මේ අනුව පෙනීයන පරිදි ඉහත සියලු වාර්තා චිත්‍රපට ශ්‍රී ලාංකීය සංවර්ධන ක්‍රියාදාමය උදෙසා ඍජුව හෝ වක්‍රව භාවිතා කර ඇති බවයි. සංවර්ධන ක්‍රියාදාමය පෙන්වීමට මෙන්ම , මහජනයා ඒ වෙත යොමු කර ගැනීමටද මෙම වාර්තා චිත්‍රපට ඔස්සේ උත්සහ කර ඇත.

වාර්තා චිත්‍රපටයන්හි තවත් එක්තරා භාවිතාවක් ලෙස, සංචාරක ව්‍යාපාරය උදෙසා එනම් රටේ සුන්දරත්වය හා ශ්‍රී ලංකාවට ආවේනික වූ ජන නැටුම්, අත්කම් ආදිය ලොවට ගෙනහැරපෑම සඳහා ද වාර්තා චිත්‍රපට නිර්මාණය වි ඇත. ඒ අතර ශ්‍රී ලංකාවේ අලංකාර කඳුකර පරිසරය පිළිබඳ කරන ලද, "කඳුරට අගනුවර" (Hill Capital) ද, ශ්‍රී ලංකාවේ අතීත උරුමයන් වන, අනුරාධපුර පොළොන්නරු නටඹුන් පිළිබඳව කරන ලද "Heritage of Lanka" ද, මාලදිවයින වෙනුවෙන් සිදුකරන ලද "The Maldives Islands " ද දැක්විය හැක.

මීට අමතරව , ශ්‍රී ලංකාවේ කලාශිල්ප හා ගෘහ නිර්මාණ යන වාර්තා චිත්‍රපටය මගින් ශ්‍රී ලාංකීය අතීත මෙන්ම එම යුගයේ කලා නිර්මාණ පිළිබඳවද නිරූපනයක් සිදුකොට ඇත. "Kandy Perahara "වාර්තා චිත්‍රපටය මගින් නුවර පෙරහැර අලංකාර ලෙස රූපගතකර ඇත.

මෙලෙස ශ්‍රී ලාංකීය අත්කම් නිර්මාණ පිළිබඳ කතා කරනු ලබන තවත් අග්‍රගන්‍ය සිනමා කෘතියක් ලෙස ප්‍රඥසෝම හෙට්ටිආරච්චි විසින් නිර්මාණය කරන ලද "Makers, Motifs and Materials" දැක්විය හැකි වේ. ඔහු මෙමගින් අත්කම් පිළිබඳ නිරූපනය කර ඇති අපූරු රූප පෙළ නිසාම , ජාත්‍යන්තර වශයෙන් සම්මානයට පවා පාත්‍ර විය. ඒ ජාත්‍යන්තර වැනිසි චිත්‍රපට උලෙලේ ඉහළම සම්මානය වන ගෝල්ඩන් මර්කරි සම්මානයෙනි.

"The Living Wild" චිත්‍රපටයද යම්තාක් දුරකට සංචාරක භාවිතාවක් සහිත චිත්‍රපටයක් ලෙසද හැඳින්විය හැකිය. ඒ ඔස්සේ නිරූපනය කර ඇත්තේ ශ්‍රී ලාංකාවේ ජාතික වනෝද්‍යාන හා ආදිවාසී ජනතාව පිළිබඳවයි.

සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීම සඳහා භාවිතා වූ වාර්තා චිත්‍රපට ද මෙම යුගයේ රජයේ චිත්‍රපට අංශය මගින් නිර්මාණය කර තිබේ. මෙලෙස නිර්මාණය වූ වාර්තා චිත්‍රපට ලෙස ජෝර්ජ් වික්‍රමසිංහගේ "කිරි බීමෙන් සනීපය ගෙනදේ" නම් වාර්තා චිත්‍රපට නිර්මාණයද, ශ්‍රී ලංකා ලේ බැංකුව හා ලේ පරිත්‍යාගය පිළිබඳව සිදුකරන ලද "Give Blood and Save a life" වාර්තා චිත්‍රපටය ද, 50 දශකයේදීම

නිර්මාණය වූ වටපණු රෝගය පිළිබඳ දැනුමත් කිරීම සඳහා නිර්මාණය කරන ලද "වටපණු රෝගය" නම් වාර්තා චිත්‍රපටය ද දැක්විය හැකිය.

භාවිතාවන් අනුව බණ්ඩනය කළ විට ආගමික භාවිතාව ඉන් එකකි. රජයේ චිත්‍රපට අංශය මගින් සියලු ආගමික පරිසරයන් යොදා ගනිමින් වාර්තා චිත්‍රපට නිර්මාණය කර ඇත. නමුත්, ඒ අතර බෞද්ධ ආගම මුල් කරගනිමින් වැඩි වාර්තා චිත්‍රපට ප්‍රමාණයක් නිර්මාණය වී ඇතිබව පෙනී යයි. එමෙන්ම කුමන භාවිතාවක් මුල් කරගනිමින් වාර්තා චිත්‍රපට නිර්මාණය වී තිබුණද ඒ හැම චිත්‍රපටයක් තුළම යම් යම් ප්‍රමාණයෙන් ආගමික භාවිතාවක් ද සිදුවී ඇතිබව දැක්විය හැක. "මී ගමුවේ මස් මරන්නෝ" කෘතියද , "නෙලුන්ගම" කෘතියද , එලෙස දැක්විය හැකි නිදසුන්ය. මේ වාර්තා චිත්‍රපට ද්විත්වයම ප්‍රධාන භාවිතාවන් වෙනත් තේමාවන් ඔස්සේ නිර්මාණය වී ඇතිමුත්, එම චිත්‍රපට දෙකෙහිම ආරම්භයේ ආගමික වතාවත්වල යෙදීම දක්වා ඇත.

මෙලෙස නිර්මාණය වූ ආගමික භාවිතාවක් සහිත වාර්තා චිත්‍රපට ලෙස, උපසම්පදාව පිළිබඳ පැවසෙන "සඟ පරපුර" වාර්තා චිත්‍රපටයත් , "බුද්ධ ජයන්තිය", වැලිවිට ශ්‍රී සරනංකර හිමියන් පිළිබඳ නිර්මාණය කරන ලද "සඟ රජ වත" වාර්තා සිනමා කෘතියද , සූත්‍ර අභිධර්ම හා විනය යන ත්‍රිපිටකයන් පිළිබඳව නිර්මාණය කරන ලද "ත්‍රිපිටක" වාර්තා සිනමා කෘතියද , වෙසක් උත්සවය පිළිබඳව කරන ලද " තෙමගුල් උළෙල" කෘතිය ද "Land of Buddha", "In the step of the Buddha", "Sacred tooth rilic from China" , "භාවනා" ආදී වූ වාර්තා චිත්‍රපට දැක්විය හැක.

කෘෂිකාර්මික භාවිතාව පිළිබඳව විමසීමේදීද විමර්ෂයට ලක් කල හැකි චිත්‍රපට කීපයක්ම 40-60 දශකයන්ට අදාලව නිර්මාණය වී ඇත . ඒ අතර "වී ගොවිතැන් කිරීමේ නව පිළිවෙළ" යන වාර්තා සිනමා කෘතිය 1951 දී ද, "ගෝව වගාව" ද, "අන්නාසි නිෂ්පාදන" නම් 1961 දී කරන ලද වාර්තා චිත්‍රපටයද, "ලංකාවේ තේ ශත සංවත්සරය" හා "ආසියාවේ කෘෂිකර්මාන්ත" ද දැක්විය හැක . මෙම වාර්තා චිත්‍රපට කෘෂිකර්මාන්තයේ කරුණු පිළිබඳ සමාජය දැනුවත් කිරීමේ භාවිතාවන් යුක්තව නිර්මාණය වී ඇත. මේ අතර තවත් වැදගත් සිනමා කෘතියක් ලෙස, සිරි ගුණසිංහ විසින් නිර්මාණය කරන ලද "රන්වන් කරල්" චිත්‍රපටය දැක්විය හැකිය . එය වෘතාන්ත වාර්තා සිනමා කෘතියක් ලෙස හැඳින්විය හැකි අතර, නූතන දැනුම යොදා ගනිමින් හොඳ කෘෂි කර්මාන්තයක් පවත්වාගෙන යන්නේ කෙසේද යන පිළිබඳවත්, උගත් නමුත් විරැකියාවෙන් පෙලෙන තරුණ පරපුර කෘෂි කර්මාන්තයට යොමු කිරීමේ අර්ථයෙනුත් නිර්මාණය වී ඇති බව පෙනී යයි.




**රූපය 2: රන්වන් කරල් චිත්‍රපටයේ තරුණිය ලෙස රඟදක්වන පුණ්‍යා හීන්දෙනිය**

මෙලෙස නිර්මාණය වූ සමාජ විද්‍යාත්මක භාවිතාවක් සහිත චිත්‍රපටද මේ අතර වේ . "මී ගමුවේ මස් මරන්නෝ" වාර්තා සිනමා කෘතිය එලෙස නිර්මාණය වූ කෘතියකි . එමගින් නිරූපනය වන්නේ මසුන් මැරීම ජීවන වෘත්තීය කරගත් මීගමුවේ ජනයාගේ ජන ජීවිතය පිළිබඳවයි. සමාජයේ ජීවත් වන එක්තරා ජන කොටසක් පිළිබඳව තවත් පිරිසකට දැනුවත් වීමට සැලැස්වීම මෙම සමාජ විද්‍යාත්මක භාවිතාවක් සහිත වාර්තා චිත්‍රපට වල අර්ථයයි. එමෙන්ම යම් යම් සමාජ අකටයුතුකම් පිළිබඳ දැනුවත් කිරීම ද මේ ඔස්සේ සිදු කල හැක. "Children in Need" යන වාර්තා චිත්‍රපටය, එලෙස ළමා අපචාර පිළිබඳව දැනුවත් කිරීම සඳහා නිර්මාණය වූ සිනමා කෘතියකි. මෙලෙස නිර්මාණය වූ අනෙකුත් සිනමා කෘති අතර, "සංචාරක මසුන් මරන්නෝ", "The living wild", "ලංකා ගුවන් විදුලි සේවයේ වාදක

කණ්ඩායම", "කරදිය", "ජන ලීලා" යන චිත්‍රපට දැක්විය හැක. මෙහි දැක්වෙන "ජන ලීලා" චිත්‍රපටයද, “The living wild” චිත්‍රපටයද ජාත්‍යන්තර සම්මානයට පාත්‍ර වූ අගනා වාර්තා සිනමා කෘතීන්ය.




රූපය 4: මී ගමුවේ මස් මරන්නෝ චිත්‍රපටයේ මසුන් එකතු කිරීම.







**රූපය 5: මී ගමුවේ මස් මරන්නෝ චිත්‍රපටයේ වෙළඳ පොළදර්ශනයක් (මාළු වෙන්දේසිය); රූපය 6: ජනලීලා චිත්‍රපටයේ පාරු පදින්නන්**







**රූපය 7: ජනලීලා චිත්‍රපටයේ පාරු වල සිට ගැල් වලට බඩු ගෙනයාම; රූපය 8: ජනලීලා චිත්‍රපටයේ දැක්වෙන දර්ශනයක්**







**රූපය 9: ජනලීලා චිත්‍රපටයේ එන පෙරහැර දර්ශනයක් (වාදනය කරමින් නර්තනය); රූපය 10: ජනලීලා චිත්‍රපටයේ එන පෙරහැර දර්ශනයක් (යක් නැටුම්)**

මෙලෙස සිදු කරන ලද තවත් භාවිතාවක් ලෙස දේශපාලනික උත්සව අවස්ථා හා දේශපාලන ප්‍රචාරණ කටයුතු සඳහා වාර්තා චිත්‍රපටය භාවිත වූ අවස්ථා දැක්විය හැකිය. මෙලෙස නිර්මාණය වූ චිත්‍රපට විශාල ප්‍රමාණයක් 50/60 දශකයන් හී දී දැකගත හැකි වේ. ඉන් කිහිපයක් පහත අයුරින් දැක්විය හැකිය.

“Commonwealth Conference”, “International Labour Organization Conference”, “Ceylon Greets the Queen” , “Queen Tours Ceylon”, “The Prime Minister’s Visit to Kalaniya”, “Amongst the Colonists”, "ගමනක අවසානය”, අගමැතිගේ කුරුනෑගල සංචාරය මෙලෙස නිර්මාණය වූ චිත්‍රපට කිහිපයකි. මෙහි "ගමනක අවසානය” සිනමා කෘතිය නිර්මාණය කර ඇත්තේ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ අවමංගල්‍යය කටයුතු තේමා කරගනිමින් ය.

මෙම යුගයේ ලංකාවේ වාර්තා චිත්‍රපට පිළිබඳ විමර්ශනය කිරීමේ දී හඳුනාගත හැකි වන්නේ , එහි තාක්ෂණික දියුණු ලක්ෂණ මෙන්ම ඉතා දියුණු කලාත්මක ලක්ෂණද ඇතුළත් වන බවයි. එමෙන්ම මෙම වාර්තා චිත්‍රපටයන්හි තේමාවන් ද වැදගත් තැනක් ගනී.

ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකයට ගෙන යාමේ විශේෂ කාර්යයක් මෙම වාර්තා චිත්‍රපට ඔස්සේ සිදුවී ඇත. එමෙන්ම ජාතික වශයෙන්ද සමාජීය දියුණුව හා දැණුවත්වීම් සඳහා ද වාර්තා චිත්‍රපටය වැදගත් කාර්යයක් ඉටුකර දී තිබේ. එහි දී වාර්තා චිත්‍රපටයේ තොරතුරු සංප්‍රේශන භාවිතාව ඉතා වැදගත්ය.

වෘතාන්ත චිත්‍රපටය නිර්මාණය සිදුවන්නේ යම් කතාවකට අනුව සකස් කරන ලද පිටපතකට අනුව වුවද, වාර්තා චිත්‍රපටය එසේ නොවේ. එයට පාදක වූ තේමාවක් වුවද එහි චරිත හෝ පරිසරය හැසිරෙනු ලබන්නේ එහි අධ්‍යක්ෂක වරයාගේ අණට අනුව නොවේ. මෙහි දී අධ්‍යක්ෂක වරයාගේ කාර්යභාරය වන්නේ, විධානයකින් තොරව හැසිරෙන ජීවිත කලාත්මක ලෙස කැමරාවට රූප ගතකොට ඒ තුළින් රූප රචනාවක් ගොඩනැගීමයි. මෙහිදී තෝරාගනු ලබන තේමාවට අදාල ලෙස රූප ගොනු කරගනිමින් චිත්‍රපටය නිර්මාණය සිදුකරනු ලබයි.

නමුත්, වාර්තා චිත්‍රපටයේම එක් ශානරයක් ලෙස හැඳින්වෙන වෘතාන්ත වාර්තා චිත්‍රපට යන ස්වරූපයේ නිර්මාණ වලදී මෙම කාර්යය මෙලෙස සිදු නොකරයි. එහිදි පිටපතකට අනුව නළු නිලියන් හැසිරවීම මගින් චිත්‍රපටය ගොඩනැගීම සිදුවේ. කෙසේ නමුත් වාර්තා චිත්‍රපටයක් මගින්, සමාජයේ පිරිසකට කතා කිරීම, පණිවිඩයක්, දැණුවත් කිරීමක් සිදුකිරීම වැනි කාර්යයන් සිදුකරනු ලබයි. එම පණිවිඩය දෙනු ලබන්නේ කවරාකාර පිරිසකට කුමන අභිප්‍රායකින්ද යන්න අනුව එම චිත්‍රපටයේ භාවිතාව තීරණය වේ. 40-60 දශකයන්හි වාර්තා චිත්‍රපටයේ භාවිතාව පිළිබඳ විමසීමේදී එය ප්‍රධාන වශයෙන් කොටස් කීපයකට බෙදිය හැක. මෙලෙස එක් වර්ගයකට පමනක් වර්ග කළ නොහැකි, එනම් බහුවිද භාවිතාවන් සහිත වාර්තා චිත්‍රපට ද නිර්මාණය වී ඇත. එමගින් සමාජයේ ජන කණ්ඩායම් කීපයකට එකවර ඇමතිය හැකි වේ. මෙලෙස නිර්මාණය වූ 40-60 දශකයන්හි වාර්ථා චිත්‍රපට කලාව දේශීය වශයෙන් මෙන්ම සමාජය දැනුවත් කරමින් විකාශය වූ අතර එහි කලාත්මක භාවයේ වටිනාකම නිසාම ජාත්‍යන්තර වශයෙන්ද ඉහළම සම්මානයන්ට පාත්‍ර වීමට හැකියාව ලැබී ඇත.

ඒ අනුව මෙම අගනා සිනමා කෘති සමාජය තුළ වර්තමානයේදීත් විකාශය විය යුතු අතර එහි කලාත්මක ලක්ෂණ පිළිබඳව සැලකිලිමත් වී, වර්තමාන කලාකරුවන්ද එවැනි වූ නිර්මාණ මගින් තම නිර්මාණයන්ට ආහාසය ලබා ගත යුතුය. එය පැරණි යැයි බැහැර කළ යුතු නොවන අතර එහි කලාත්මක ගුණය අදට මෙන්ම හෙටටත් වලංගු බවද නිර්මාණ නැරඹීමෙන් පසක් කර ගත හැකිවේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


ඇතුගල, ආරියරත්න, ඇතුළු පිරිස. 2012. ප්‍රතිබැහැදක්ම, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, මුද්‍රණය- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

අබේසේකර, තිස්ස, ඇතුළු පිරිස. 2000. සිරිලක සිනමා සමරු සටහන් එදා මෙදා මතුදා, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ ප්‍රකාශන අංශය.

නිහාල්, බර්ට්‍රම්. 2014. සිනාරියෝ - වාර්තා චිත්‍රපටකරණය, ලක්මාලි මුද්‍රණාලය, Bert Publication ප්‍රකාශනය හා බෙදාහැරීම.

මෙන්ඩිස්, එම්. ආර්. 2003. සිංහල සිනමාවේ ආරම්භක පසුබිම,ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී ද එස්. කුලරත්න මාවත, කොළඹ.

මහින්දපාල, එම්. ඩී. (පරි). 2006. සිනමාව හා ජන සමාජය - රොජර් මැන්වෙල්, සරසවි ප්‍රකාශකයෝ,30, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.

රත්නායක,මනෝජ් ප්‍රසන්න. 2013. සිනමාවේ ගමන්මග,ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී ද එස්. කුලරත්න මාවත, කොළඹ.

වික්‍රමගේ,පියසේන. 2003. සිනමාවේ 50 වසරක් ලෙස්ටර් ජේම්ස් පීරිස්, සර්වෝදය විශ්වලේඛා ප්‍රකාශනයක්.